# නැගෙනහිර ජයග්‍රහනය සහ දකුණේ ප්‍රතිචාර

නැගෙනහිර මහින්දගේ ජයග්‍රහනය අපට නම් පුදුමයක් නෙවෙයි. එය පිල්ලෙයාන්ගේ පමණක් නොව හමුදාවල සනනද්ධ බලය යොදා ගනිමින් කරන ඡන්ද මංකොල්ලයක් හැටියට අපි මේ කොළම තුළින්ම පෙන්නල දුන්න.

අපි ඉල්ලා සිටියේ යූඇන්පීය, දෙමළ සංධානය හා අනෙකුත් පක්ෂ එකතුවෙලා මේ හොර ඡන්දය පවත්වන එක වළක්වන්න කටයුතු කළ යුතුයි කියලයි.

ඒ වගේ දැවැන්ත උද්ඝෝෂණයක් කළා නම් ඇත්තටම මැතිවරණ කොමසාරිස් වුණත් තීන්දු ගන්න තිබුණ මේ ඡන්දය තියන්න සුදුසු නෑ කියල. එහෙම නැතිනම් උසාවි තීන්දුව වුණත් දෙන්න තිබුණ මේ ඡන්දය පැවැත්වීමට ඇත්ත පදනමක් නෑ කියල.

මේ විදියට මහින්දගේ මගඩි ඡන්ද උපාය පරද්දන්න තිබුණත්, ඒ ඇත්තෝ කල්පනා කළේ ඡන්දය තුළ තමන්ට ලොකු වාසියක් හදාගන්න පුළුවන්, ඒ තුළින් ලොකු ප්‍රහාරයක් මහින්දට දෙන්න පුළුවන් කියලයි.

සමහර විට පිල්ලෙයාන්ට දෙමළ ඡන්ද ළං කරගන්න කොහොමටවත් බෑ කියල හිතුව වෙන්න පුළුවන්. එහෙත් මේ ඡන්දය තුළදී දෙමළ පෙදෙස්වල පෙට්ටි පුරවගන්න එක හොඳට සැලසුම් කරල ක්‍රියාත්මක කරගන්නට පිල්ලෙයන්ට හැකි වුණා.

මේ හොර නාඩගමට කත් අදින්න ගිය රනිල් මෙන්ම අනෙකුත් විරුද්ධ පක්ෂ නායකයින් ඉන්නේ ඉතාම ලොකු අවුලක. මහින්දට නම් දැන් තියෙන්නේ කෙටි කලකට වාසිදායක තත්වයක්. ලොකුවට මැජික් පෙන්නපු සන්නාසියෙක් වගේ ජනයා බිරාන්තට්ටු කරගෙන ටික කලක් ඉන්නට පුළුවන්.

වැඩි කලක් යන්නට කලින් මේ බොරු ඡන්ද ගැන නොතකා වීදි බහින්න ජනතාව සූදානම් වන බව අපට පෙනෙනව. බඩගින්න, වැඩිවන අසහනය නිසා හැම කෙනෙක්ම සටන් මහට තල්ලු වේවි. එතැනදී එක්සත් ජාතික පක්ෂය තියා ජනතා විමුක්ති පෙරමුණටවත් කියන්න දෙයක් නෑ.

දැනටත් ජනතාව දකින්නේ ඇත්ත තත්වයට මුහුණ දෙන්න බැරි නායකයින් හැටියටයි මේ අය.

එක්සත් ජාතික පක්ෂය ලොකුවට කථා කළේ මේ නැගෙනහිර ඡන්දයෙන් දිනල මහ ඡන්දයකට ආණ්ඩුවට බලපෑම් ඇති කරන බවයි.

ඒත් දැන් වුණේ ඒකේ අනෙක් පැත්ත. ඉතිරි යූඇන්පී මන්ත්‍රීවරුන් ආණ්ඩුවට පනීවි කියන බය දැන් ඇති වෙලා තියෙනව. කොහොමටත් මහින්දට පාර්ලිමේන්තුව තුළ ලොකු ප්‍රශ්නයක් ඇති කරන්නට රනිල්ට බෑ.

අනෙක් අතට ජනතා විමුක්ති පෙරමුණත් මේ ඡන්දයේදී රෙදි ගලව ගත්ත. චණ්ඩිකම් කථා කරන, චණ්ඩිකම් කරන පක්ෂයක් හැටියට බලුවෙන්න පැරදිලා මැර බලයට විරුද්ධව උඩුබුරළන එක තේරුමක් නැති දෙයක්.

පිල්ලෙයාන් ප්‍රභාකරන්ට විරුද්ධව ඉන්න ලොකුම විමුක්තිදායකයා ලෙස හඳුන්වල දැන් එකපාරටම අංගුලිමාල කෙනෙක් හැටියට නම් කළත් ඒක ගිල ගන්නට හැමෝටම බෑ. ඇත්තටම විමල් වීරවංශට වත් ඒ බෙහෙත ගිල ගන්නට බැරි වුණා.

මහින්ද මගින් ධනපති රාජ්‍ය ශක්තිමත් කිරීම පිළිබඳ අදහස ඇත්තටම සෝමවංශ, ටිල්වින් ආදීන්ගේ මිස විමල්ගේ නෙවෙයි.

මේ මෝඩ අදහස මගින් මහින්ද රජය විශාල ශක්තියක් ලබා ගත්තා.

දැන් ඒ බලයෙන් බැට කන තැනට මේ නායකයෝ පත්වෙලා. අනෙක් අතට මේ රාජ්‍යය දේශීය රාජ්‍යයක් නෙවෙයි ගෝලීය බලවතුන්ගේ තැරැව්කාර ඒජන්ත රාජ්‍යයක් බව දැන් හොඳටම ඔප්පු වෙනවා.

මේ රාජ්‍ය බලය ගොඩනැගීමට වාල්කම් කළේ පැරණි වමේ පක්ෂ. වාසුදේව මාසෙකට රුපියල් 60,000 ක් සමඟ විශාල වරප්‍රසාද ලබාගනිමින් මහින්දගේ උපදේශකයෙක් වුණා. ඩිව්, තිස්ස ආදීන් ඇමතිකම්වලට වහල් වුණා.

මේ මගින් මහින්දට ලබා දුන් සහයෝගය තුළින් දරුණු බලයක් ගොඩනගා ගැනීමට ඔහුට හැකි වුණා. ඇත්තටම රනිල් අද ගෝලීය බලවතුන්ටත් අවශ්‍ය නෑ. මොකද? මහින්ද ඉතා ශක්තිමත් ලෙස ගෝලීය න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යන නිසා.

සිරිමාවෝගේ හෝ චන්ද්‍රිකාගේ කාලයේදී තිබුණ දේශීය හෝ ප්‍රජාතන්ත්‍රවාදී අර්ථයවත් මේ රජයට නෑ. එය ඉන්දියාවේ දෙපා මුල වැඳ වැටෙන ඒ මගින් ගෝලීය බලවතුන්ට බැඳුන රජයක්.

මේ රජය ශක්තිමත් කිරීමට පියවර ගැනීම තුළින් ඉතාම බාල්දු තැනකට මේ වාමාංශිකයින් වැටිල තියෙනව. මහින්දගේ ඉඳුල් කමින් ආවඩමින් ඉන්න ගමන් ලෝකයා රැවටීමට විවිධ ඇනුම්පද ආණ්ඩුවට කියනව. ඒ අතර හැන්දෑවට හාම්පුතා හමු වී සමාව ගන්නවා.

මේ විගඩම් දේශපාලනය වාසුදේව, ඩිව්, තිස්ස වැනි කොන්ද නැති දීනයන්ට වුණත් කොච්චර කලක් කරගෙන යන්න පුළුවන්ද කියන එක ප්‍රශ්නයක්.

තමන් කරන පාප කර්මවලට පව් ඇරීම වෙනුවෙන් මේ බන්ගෝස්ලා මැයි දිනයේ රතු බේරෙන කමිස ඇඳගෙන දැකැති මිටි උස්සාගෙන පෙළපාලි ගියා. හැබැයි මහින්දගේ දරුණු පාලනයට පහර එල්ල කරන්නේ නැතිව අනෙක් හැම දේ ගැනම තප්පුලන්ට මේ අය පියවර ගත්තා.

පුදුමයකට වගේ සමහර කම්කරුවන්ටත් මේ රහපෑම ලොකු දෙයක්.

ධනපති රජයෙන් ඉඳුල් කන ගමන් අභියෝග කිරීමෙන් ධනපති පංතියේ නිළධාරීන් බය කරන්න පුළුවන් කියල සමහරු හිතනව. තවත් සමහරු තමන් හොර රහසේ එකතු කර ගත් පිංකැට ටික අහුවෙලා කරදර වෙයි කියලත් හිතනව ඇති.

ධනපති පාලකයින්ට සැර කරල ඉල්ල ගන්නව මිසක් ඒ පංතියෙන් බලය උදුර ගන්න තරමට හයියක් මේ පංති කොටසට නෑ. ඒ නිසා ඔවුන් හදන්නේ තම නායකයින් මගින් ආණ්ඩුවට තරමක තර්ජනයක් එල්ල කිරීම පමණයි. ඒ අතර ඒ ධනපති තුරුල්ලෙම ලගින එකත් ආරක්ෂාවට හොඳයි කියල හිතනව.

විශේෂයෙන්ම සිංහල ජාතිවාදය තුළින්ම මහින්ද ලබා ගත් පදනම ගැනත් මොවුන් බයයි. එම නිසා එම භීතිය තුළ වාසුදේව වැනි දීන දේශපාලකයින් ඔවුන්ට ප්‍රයෝජනයි.

එතකොට ටිල්වින්ලා ආණ්ඩුවේ ජාතිවාදී යුධවාදී ගමන සමඟ යන්න ලෑස්ති නැත්නම් දැන් මොකද කරන්න යන්නේ. පහුගිය කාලේ මේ රටේ ලොකුම හතුරා ප්‍රභාකරන් කියපු මිනිස්සු දැන් එක පාරටම මහින්ද ලොකුම හතුරා කියන්න පටන් අරන්.

මේක හොඳ තත්වයක්. ඒත් දෙමළ ජනතාවගේ සටන ගැන මොකද ටිල්වින්ලා කියන්නේ? ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදය ජනතා විමුක්ති පෙරමුණේ ත්‍රස්තවාදය වගේම වැඩක් නැති විසකුරු සටන් ක්‍රමයක්. ඒක ගැන කෑ ගහන ටිල්වින්ලා තමාගේ තමාගේ කුරිරු ත්‍රස්තවාදී ඉතිහාසයටත් විරුද්ධ වෙනව.

ඒක හොඳයි. ඒත් ත්‍රස්තවාදය සටන් ක්‍රමයක් විතරයි. ඒත් උතුරේ ජාතික අරගලය දේශපාලනයක්. ඒ ගැන මුණ්නැහේලා මොකද කියන්නේ? මෙන්න මේ කාරණය උඩයි මුණ්නැහේලගේ ඉදිරි කාලයේ ගමන තීන්දු වෙන්නේ. ඒක ගැන කට පියා ගෙන බොරු වාචාලකම් කීමෙන් වෙන වැඩක් නෑ.